


**මෙම සමාගමේ කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල/ කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපොල රත්මලාන පවතින පහත සඳහන් තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## කාර්මික ශිල්පී (පෙදරේරු) II වන ශ්‍රේණිය

**රැකියාවේ ස්වභාවය** : අධීක්ෂණ නිළධාරීන් විසින් පවරනු ලබන පරිදි අත්තිවාරම් කැපීමට ලණු ගැසීම, අත්තිවාරම් බැඳීම, කොන්ක්‍රීට් දැමීම, බිත්ති බැඳීම, කර්බ් සවි කිරීම, කුමේර බැඳීම, කපරාරු කිරීම, ගඩොල් ඇතිරීම, ටයිල් කිරීම, සිමෙන්ති දැමීම ආදී සියළුම පෙදරේරු වැඩ සහ අළුත් වැඩියාවන් සිදු කිරීම.

**රැකියාවේ වගකීම්** :

(I) පෙදරේරු යන්ත්‍ර සහ උපකරණ ආරක්ෂාකාරී ලෙස වගකීමෙන් පරිහණය කිරීම හා නඩත්තු කිරීම.

(II) එදිනෙදා පවරනු වැඩ හා භාවිතා කරන ද්‍රව්‍ය පිළිබඳව වාර්තා තබා ගැනීම.

(III) රාජකාරී කාලය තුල නිල ඇඳුමින් සැරසී සිටීම, එහි පරිසිදු භාවය ගැන සැලකිලිමත් වීම, සහ පුද්ගල ආරක්ෂණ උපකරණ නිසි පරිදි භාවිතා කිරීම.

(IV) සුපරීක්ෂකවරුන් විසින් පෙදරේරු වෘත්තිකයන්ට පවරනු ලබන සියළුම රාජකාරීන් ඉටු කිරීම.

(V) අත්‍යාවශ්‍ය අවස්ථාවන්වලදී ආයතනයට අවශ්‍යවන කුමන හෝ රාජකාරියක් ඒ ඒ අවස්ථාවන්වලට ගැලපෙන පරිදි ඉටු කිරීමට හැකිවීම.

(VI) කටුනායක ගුවන්තොටුපොල පරිශ්‍රයෙන් බැහැර රත්මලාන, පිදුරුතලාගල, කතරගම හෝ මත්තල හෝ වෙනත් දුර බැහැර ස්ථානයක අදාළ රාජකාරී ඉටු කිරීම.

**සුදුසුකම්** :

(අ) කාර්මික විද්‍යාලයක් මගින් හෝ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (T.V.E.C.) විසින් පිළිගනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන එක් අවුරුදු (01) පූර්ණකාලීන පාඨමාලාවක් පෙදරේරු ක්ෂේත්‍රයෙන් සාර්ථකව හදාර තිබීම.

**හෝ**

ජාතික වෘත්තීය සුදුසුකම් 4 වන මට්ටමේ (NVQ Level 4) වෘත්තීය සහතිකයක් පෙදරේරු ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

**සහ**

(ආ) ආධුනිකත්ව කාලසීමාවද/ පාඨමාලා කාල සීමාවද / පුහුණු කාල සීමාවද ඇතුලත්ව සිව් (04) වසරක පළපුරුද්දක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

**වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

2/-

**වැටුප** : තෝරාගනු ලබන්නන්හට සියළු දීමනා සහිත ආකර්ෂණීය වැටුපක් හා ප්‍රතිලාභ රැසක් හිමිවේ.

**බඳවා ගැනීමේ ක්‍රමය** : ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**පොදු කරුණු :-**

ඉහත තනතුරු සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් සමාගමට අයත් දිවයිනේ පිහිටි ඕනෑම සේවා ස්ථානයක අවශ්‍ය වූ විට සේවය කල යුතුවේ.

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් මෙම වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කල අයදුම්පත්‍රයක් **සභාපති , ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල, කටුනායක** යන ලිපිනයට 2025 **ජුනි මස** 06 **වන දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ කුරියර් සේවා මගින් පමණක්** ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්පත් බහාලන කවරයේ වම් කෙළවරේ **කාර්මික ශිල්පී (පෙදරේරු)** 11 **වන ශ්‍රේණිය** ලෙස සඳහන් කළ යුතුවේ.

**පාඨමාලා සහතික, සේවා සහතික සහ අදාළ සහතිකවල ජායා පිටපත් සමග ඉදිරිපත් නොකරන අයදුම්පත් සහ අපගේ වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**තෝරා ගැනීමේ ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසුකම් ලත් අයදුම්කරුවන්ට පමණක් දැනුම් දෙනු ලැබේ.**

---

**සභාපති**
**ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල**
**කටුනායක**

**Advertised on 25/05/2025**